# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ............................................

දිනය / திகதி / Date: 2021.11.15

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2021/15 ට පළමු එකතුව**

සියළුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්,
වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෙත ,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් සමෘද්ධි සංවර්ධන නිළධාරීන් (ක්ෂේත්‍රගත) හරහා සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ක්‍රියාත්මක කරන "සමෘද්ධි මිතුරු ක්ෂණික ණය" යෝජනා ක්‍රමය.</u>**

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු වටා ඒකරාශී වී සිටින සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩුආදායම්ලාභීන් වන බැංකු සාමාජිකයන් වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන නිළධාරීන් (ක්ෂේත්‍රගත) හරහා මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක වේ.

දැනට මෙම ණය වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර, මෙම ණය වැඩසටහන අනෙකුත් ග්‍රාමසේවා වසම් සඳහා ද ව්‍යාප්ත කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ තීරණ අංක 2021/92/09 මගින් අනුමැතිය සහ උපදෙස් ලැබී ඇත.

02. මුල් චක්‍රලේඛ අංක 2021/15 හි ඡේද අංක 2.3 සංශෝධනය කරන අතර, 2021.11.15 දින සිට සමෘද්ධි බැංකු බල ප්‍රදේශවල සියළුම ග්‍රාම නිළධාරී වසම්වල මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදෙනු ලැබේ.

03. මෙම ණය වැඩසටහන යටතේ ව්‍යාපෘති ණය ලෙස ලබාදුන් රු.10,000/- ක මුදල රු. 20,000/- දක්වා වැඩිකරන අතර, අනෙකුත් ණය කාණ්ඩය යටතේ ලබාදෙන ණය මුදල තවදුරටත් නොවෙනස්ව පවතී

04. සමෘද්ධි මිතුරු ණය වැඩසටහන යටතේ වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් විසින් ණය ලබාදීමෙන් උපයන පොළී ආදායමෙන් ණය සඳහා පොළී ගෙවීම ඇතුළු අනෙකුත් වියදම් අඩු කර යම් කිසි අතිරික්තයක් (ලාභයක්) උපයාගන්නේ නම් එම මුදල අදාල නිළධාරියාට හිමි වේ.

05. මෙම ණය වැඩසටහන සමෘද්ධි බැංකු විසින් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති නම්, කඩිනමින් මෙම ණය ලබාදීම ක්‍රියාත්මක කරන ලෙස දන්වා සිටිමි.

06. සංශෝධන මෙපමණ වන අතර, අනෙකුත් උපදෙස් සඳහා මුල් චක්‍රලේඛ අනුව කටයුතු කරන ලෙස තවදුරටත් දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස..
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස හා අ.ක.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |